*සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,678 - 2010 ඔක්තෝබර් මස 29 වැනි සිකුරාදා - 2010.10.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1702 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1707 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1713 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

### බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. විස්තර පහත උපලේඛනයේ දැක්වේ.

**උපලේඛනය**

| | *තනතුර* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. | පුස්තකාල සහාක | රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600 (12 වැනි පියවරේ සිට) | යටත් පිරිසෙයින් 08 වැනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත් ව තිබීම. |
| 02. | රියදුරු II ආ | රු. 12,470 - 10 x 130 -10 x 145 10x160 - 12 x 170 -රු. 18,860 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය/නවය වසර සමත් වී සිටිය යුතු ය.<br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය.<br>වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුයි.<br>අවම උස අඩි 05 1/2ක් විය යුතුයි.<br>දිවා කාලයේදී හා රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |
| 03. | කාර්යාල කාර්ය සහායක කා.සේසේ. II වැනි පන්තිය | රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600 (12 වැනි පියවරේ සිට) | රජයේ පිළිගත් පාසලකින් 8 වැනි ශ්‍රේණිය/නවවන වසර සමත්වී තිබීම. |
| 04. | මාර්ග කම්කරු කා සේ. සේ. III වැනි පන්තිය | රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600 | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වීම. |
| 05. | මුරකරු කා සේ. සේ. II වැනි පන්තිය | රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600 (12 වැනි පියවරේ සිට) | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වීම. |

**02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :***

01. අයැදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
02. අයැදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
03. අයැදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකු විය යුතු ය.
04. අයැදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුයි.
05. බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සේවයේ යෙදී සිටින්නන් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. (වයස් සීමාව බල නොපායි).
06. අයැදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

**03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :***

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ හා නියෝගවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද පළාත් පාලන දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

**04.** අයැදුම් කළයුතු ආකාරය :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (12" x 8" ප්‍රමාණයේ) අයැදුම්පතක් සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2010.11.15 දිනට පෙර "සභාපති, බෝපේ-පොද්දල ප්‍රාදේශීය සභාව, කලේගාන, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයැදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය :

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. ග්‍රාම නිලධාරි මගින් නිකුත් කරන පදිංචිය තහවුරු කිරීමේ සහතිකය ;
4. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික;
5. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

එස්. ඩී. ද සී. දසනායක,
ලේකම්,
බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

***බෝපේ- පෝද්දල ප්‍රාදේශීය සභාව***

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ ..............................................තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම :——————————,
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————,
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————,
3. ස්ථිර ලිපිනය :——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————,
5. ස්ත්‍රී /පුරුෂ භාවය :——————————.
6. උපන් දිනය :
   අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————.
7. 2010.11.15 දිනට වයස :
   අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
8. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————————.
9. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————————,
10. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :——————————,
    සේවා පළපුරුද්ද:——————————.
11. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්කරු වන, ......................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයැදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————————,
පදවි නාමය :——————————,
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————,
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :——————————.

10-885

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ගෙන් 2010.11.30 දින ප.ව. 2.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. (වලල්ලාවිට බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත.)

#### *උපලේඛනය*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. | ආයුර්වේද ඖෂධ සංයෝජක II ශ්‍රේණිය | 01 | PL 3 - 2006A<br>රු. 12,470 - 10 x 130 -10 x 145 - 10x160 - 12 x 170 -රු. 18,860<br>(23 වැනි පියවර) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සහ සිංහල දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 6කින් සාමාර්ථය ලබා තිබීම, හෝ ජාතික අධ්‍යාපන පොදු සහතිකපත්‍ර විභාගයෙන් එක්වරකදී ගණිතය, සිංහල දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 6කින් සාමාර්ථය ලබා තිබීම සහ රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. |
| 02. | පුස්තකාල සහායක II ශ්‍රේණිය | 01 | PL 3 - 2006A<br>රු. 11,730-10x120-10x110 - 10x120 - 12 x 130 -රු. 16,590<br>(12 වැනි පියවර) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.)විභාගයෙන් සිංහල සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් සමත් විය යුතු අතර, පුස්තකාල අධ්‍යාපනය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |
| 03. | කාර්යාල කාර්ය සහායක II ශ්‍රේණිය | 01 | PL 1 - 2006A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600<br>(1 වැනි පියවර) | සිංහල භාෂාව, ගණිතය ඇතුළුව අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් එකවර විෂයයන් 06ක් සමත් විය යුතුය. |
| 04. | ආදායම් පරිපාලක II ශ්‍රේණිය | 01 | M.N.I.<br>රු. 12,920-10x120-11x140 - 6 x 210 - 14 x 290 -රු. 21,700<br>(1 වැනි පියවර) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය, වාණිජ අංක ගණිතය /ගණිතය සහ සිංහල, දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නකු වීම.<br><br>හෝ<br><br>1. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ ගණිතය හා සිංහල දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 05කින් සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br><br>2. මේ සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් මගින් තීරණය වන කුසලතාවය මත පවත්වනු ලබන සම්පූර්ණ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදු කෙරේ. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

01. අයැදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
02. අයැදුම්කරු වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අයැදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්නයේ වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
03. අයැදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.)
04. අයැදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතු ය.
05. වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලිකව, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් (වැඩ ඒකකය) සේවයකරනු ලබන සේවකයන් කෙරේ වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
06. අයැදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට මුදල් රෙගුලාසිවලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (12" x 8" ප්‍රමාණයේ) අයැදුම්පත සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා ................................ දිනට පෙර "ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයැදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය තහවුරු කිරීමේ සහතිකය ;
4. මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය;
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
6. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික;
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;

එම්. එම්. ඉන්ද්‍රා කාන්ති,
ලේකම්,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,
මීගහතැන්න.

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,
මීගහතැන්න.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................................තනතුරු සඳහා බඳවා ගැනීම***

1. මුලකුරු සමග නම :——————————,
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————,
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————,
3. ස්ථිර ලිපිනය :——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————,
5. ස්ත්‍රී /පුරුෂ භාවය :——————————. විවාහක/අවිවාහක බව :——————————.
6. උපන් දිනය :
   2010 —————— දිනට වයස :
   අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? දිනය :——————————.
8. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):
   (i) සමත්වූ වසර/ශ්‍රේණිය :——————————,
   (ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————————,
   විභාග අංකය :——————————,

විභාග වර්ෂය හා මාසය :——————,
සමත්වූ විෂයයන් :——————,

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

(iii) අ.පො.ස. (උ.පෙළ) විභාගය :
විභාග අංකය :——————,
විභාග වර්ෂය හා මාසය :——————,
සමත්වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |

09. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :——————,
10. සේවා පළපුරුද්ද:——————.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?:——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දත්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයැදුම්කරු වන, ........................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයැදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————,
පදවි නාමය :——————,
දෙපාර්තමේන්තුව/ආයතනය :——————,
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :——————.

10-972

---

## සංශෝධනයයි

### කුරුණෑගල ප්‍රාදේශීය සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.10.09 වැනි දිනැති අංක 1623 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් තනතුරු අතරින් වැඩ පරිපාලක තනතුරට අදාළ *ගැසට් නිවේදනය* සංශෝධනය කිරීම

වැඩ පරිපාලක තනතුරට අදාල පහත සඳහන් කරුණු ප්‍රමාද දෝෂයක් නිසා නැවත සංශෝධනය කර ඉදිරිපත් කරමි.

1. වැඩ පරිපාලක තනතුරට අදාල වැටුප් පරිමාණයඃ PL 2-2006A රු. 12,210 - 10 x 130 -10 x 145 - 10 x 160 -12 x 170 - රු. 18,600
2. අවශ්‍ය සුදුසුකම් :
   I. බාහිර අයැදුම්කරුවන් සඳහා - අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් (02) සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)
   II. අභ්‍යන්තර අයැදුම්කරුවන් සඳහා පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා රජය මගින් අනුමත කරනලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම (මෙම තනතුර අර්ධ ශිල්පීය සේවක ගණයට අයත්වේ.)
3. *ශිල්පීය නිපුණතා* .- තනතුරට අදාළව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N,V,Q 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබාතිබීම.
4. *පළපුරුද්ද* .- තනතුරට අදාළ ක්ෂේත්‍රයේ, රජයේ ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබීම (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.

2009.10.09 දිනැති උක්ත *ගැසට් පත්‍රයේ* සඳහන්කර තිබූ ආකාරයට ඔබේ ඉල්ලුම්පත් 2010.11.15 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වනු ලැබේ.

අයි. ඒ. බණ්ඩාර,
ලේකම්,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය, බෝයගනේ.

10-1056

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තියප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් වල හිමිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවක් පලකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අල්හාජ් ඒ. එල්. එම්. උවයිස්,<br>සභාපති,<br>උඩුනුවර ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

| *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස ඉඩම් හිමිතරුවන්* | *දකුණු පස ඉඩම් හිමිකරුවන්* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|
| 01. දෙහිදෙණියවත්ත පාර | | | 1. ඒ. එල්. එම්. මුහුසීන්<br>2. ඒ. එල්. එම්. ෆලීල්<br>3. ඒ. එල්. එම්. සවාහීර්<br>4. එම්. ජේ. මුන්තාජ්<br>5. බී. අයි. එම්. හනීෆා | 1. ඕ. එල්. අනාස් මොහොමඩ්<br>2. ඕ. එල්. එම්. සුෆියාන්<br>3. ඕ. එල්. එස්. පරදා<br>4. ඕ. එල්. එම්. රසික් | මීටර් 75 .0 | අඩි 5.00 |
| 02. වැලියංග පාර | දවුලගල-වටදෙණිය ප්‍රධාන මාර්ගයේ බඹරදෙණිය පල්ලිය අසලින් | බඹරදෙනිය ගම්මායිමේ රජ මාවත ගම්සභා පාර | 1. ඒ. එම්. නියාස්<br>2. ආර්.එම්.බී ජයසුන්දර<br>3. බී. ඩබ්. ජේ. එම්. එච්. සහීඩ් | 1. ඩබ්. ඒ. එම්. අබේරත්න<br>2. ඩබ්. ඒ. එම්. අත්තනායක<br>3. ඩබ්. ඒ. එම්. නවරත්න | මීටර් 206 | අඩි 8.00 |
| 03. මල්පැලගොඩහේන | ගම්පොල පාරේ සීබී ස්ටෝර්ස් කඩය | පිටවලවත්ත පස් පිළිම විහාරය පසු කර ජයසේන මුදලාලිගේ කඩය අසල | 1. විමලා විජෙසිංහ<br>2. කේ. එල්. ඩී. කුමුති කුමාර | 1. කේ. ජී. නිමල් රණසිංහ<br>2. එම්. ඒ. ග්‍රේස් පෙරේරා<br>3. ඒ. ජී. චන්දිම සුරංජිත්<br>4. ඩබ්. එස්. ඩබ්. කේ. විජේරත්න | මීටර්60.00 | අඩි4.00 |
| 04. ශ්‍රී නාථදේවාලය සිංහාසනය අසල සිට ගමමැද ගම්සභා පාර | ශ්‍රී නාථ දේවාලය සිංහාසනය අසල | ගම මැද ගම්සභා පාර මැද දක්වා | 1. ඒ. එම්. සෝමාවතී<br>2. ජී. එච්. එම්. පුංචි නිළමේ<br>3. ඒ. එම්. පුංචි මහත්මිය<br>4. ඒ. එම්. සෙනෙවිරත්න<br>5. එස්. එම්. ඥානරත්න | 1. එච්. එම්. අබේරත්න බණ්ඩා<br>2. කේ. එම්. එස්. කේ. විජේසිරි<br>3. සී. එම් ලොකුබණ්ඩා<br>4. ඒ. එම්. සෝමාවති<br>5. ඒ. එම්. සෙනවිරත්න<br>6. එස්. එම්. ඥානරත්න | මීටර් 140.0 | අඩි 5.00 |
| 05. බුලුවැලකුඹුර හරහා දිවෙන ලුණුගම ගම්සභා ඇළවේල්ල | තලවතුර-වැලිගල්ල මාර්ගයේ පල්කුඹුර පාළම අසල | බී. කේ. දිසානායක මහතා ගේ කුඹුර අසළට | 1. එච් එම්. ගුණරත්න බණ්ඩා<br>2. ජී. ජී. චන්ද්‍රමාලනී<br>3. එන්.එම්. බී. කුලරත්න<br>4. එස්. එම්. පුංචිබණ්ඩා<br>5. ජී. එම්. ඥානවතී | 1. අතුල සෙනවිරත්න<br>2. සම්පත් අලහකෝන්<br>3. ඩී. එම්. එස්. එස්. දසනායක<br>4. එච්. එම්. ඩී. හේරත්<br>5. ඒ. එම්. ටී. අමරකෝන් | මීටර් 800.0 | අඩි 8.0 |

| මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම් පස ඉඩම් හිමිතරුවන් | දකුණු පස ඉඩම් හිමිකරුවන් | දිග | පළල |
|---|---|---|---|---|---|---|
| | | | 6. එච්. එම්. ජයතිලක<br>7. එච්. එම්. එස්. හේරත් බණ්ඩා<br>8. එච්. එම්. හේරත් බණ්ඩාර<br>9. කේ. එම්. බණ්ඩාර මැණිකේ<br>10. ජයතිස් අමරකෝන්<br>11. ඒ. එම්. ටී. අමරකෝන්<br>12. එච්. එම්. පුංචිබණ්ඩාර<br>13. ඒ. එම්. කරුණාතිලක<br>14. ඒ. එම්. ජයතිලක උඩගෙදර<br>15. පියසේන පලිහවඩන | 6. ආර්. එම්. කුඩාබණ්ඩා<br>7. ඩබ්. ආර්. එම්. එච්. බණ්ඩාර මැණිකේ<br>8. සී. බී. අමරකෝන්<br>9. ඒ. එන්. එම්. බණ්ඩාර මැණිකේ<br>10. පියසේන පලිහවඩන<br>11. බී. කේ. දිසානායක<br>12. ආර්. සී. හරසිංහ<br>13. ආර්. කේ. එන්. අයි. රත්නායක | | |
| 6.බටුපිටිය වැටැස්සපාර | වාදෙනිය ප්‍රධාන මාර්ගයේ සිට | බටුපිටිය වැටැස්ස පාර | 1. එස්. එම්. නසාර්<br>2. එල්. එම්. ජමල්දීන්<br>3. එස්. නුරුල් අමීන්<br>4. අස්මියා සියාද්<br>5. යූ. එල්. සරෆදීන් | 1. එස්. එම්. මාහීර්<br>2. නුරුල්නිසා<br>3. එස්. එම්. මුක්තාර්<br>4. එච්. එල්. එම්. මතාජ්ෆදීන්<br>5. ඒ. ආර්. එල්. එම්. මහරුෆ්<br>6. ඒ. ආර්. එම්. මසුද්<br>7. ඒ. එල්. එම්. වාහීඩ්<br>8. අයිදුල් රවුෆ් | මීටර් 150.00 | අඩි12.0 |
| 7.මහකුඹුරවත්ත සිට කොස්වැටිය මාර්ගය | මහකුඹුරවත්ත සිට | කොස්වැටිය නෝනාවත්ත පාර මංසන්ධිය | 1. ආර්. ඩී. පී. ප්‍රනාන්දු<br>2. ජේ. ඒ. පියරත්න<br>3. පී. පොන්නයියා | 1. කොට්ගිට් අරච්චාවල<br>2. ජේ. ජී. ප්‍රේමරත්න<br>3. සින්නපෙරුමන් පොන්නයියා<br>4. ඒ. එම්. නන්දාවතී අලහකෝන්<br>5. ජේ. ජී. ශීලාවතී | මීටර් 500.0 | අඩි 10.0 |
| 8. සමගි මාවත | ගොඩපළ බෝධිරාජ පාරේ සිට කඹුරුදෙණිය දක්වා දිවෙන මාර්ගය | පොන්නානියවත්ත පොදු සුසාන භූමිය දක්වා පැමිණ පොන්නානියවත්ත ජනපද මාර්ගයට පිවිසීම | 1. ඩී. ජී. ආර්. රාජපක්ෂ<br>2. ඩී. එම්. ජේ. පී. දිසානායක | 1. ඩබ්. ආර්. පී. පනාගොඩ<br>2. පී. කේ. චන්ද්‍රදාස<br>3. පී. ජී. දයාවති<br>4. චමින්ද තිලකරත්න | මීටර් 600.0 | අඩි 6 0 |
| 9.දස්කර මුස්ලිම් පල්ලිය පරතලාව කෙහෙල්වල දස්කර ජාතික පාසල පාර | දස්කර ජුම්මා පල්ලිය | දස්කර ජාතික පාසල තලවතුර පාර | 1. බී, එම්. මහරුෆ්<br>2. බී. එම්. සිද්දික්<br>3. එස්. එම්. එස්. අස්මි<br>4. එම්. එස්. එම්. සිද්දික්<br>5. එම්. එස්. එම්. රිස්වාන්<br>6. එම්. ආර්. එම්. රසාද්<br>7. එම්.ඒ.ඒ.ෂල්මාන්<br>8. ජේ. එම්. නිසාර්<br>9. එන්. ඒ. උම්මා<br>10. එම්. ආර්. නූර්ලයිමා<br>11. එම්. ආර්. වයිරුන් නිශා<br>12. එම්. ආර්. එම්. නදීර්<br>13. එච්. එල්. ජෙම්බරක් (එස්. එම්. නියාස්)<br>14. උම්මු ෂල්මා | 1. පල්ලිය<br>2. පල්ලිය<br>3. එච්. එල්. රම්සාන්<br>4. එච්. එල්. හනිෆා<br>5. පල්ලිය<br>6. පල්ලිය-එම්. අයි.එම්. හනිෆා<br>7. එස්. එම්. නියාස්<br>8. ඒ.එස්. එම්. මුනෂි | මීටර් 350.0 | අඩි3.0 |

| මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම් පස ඉඩම් හිමිකරුවන් | දකුණු පස ඉඩම් හිමිකරුවන් | දිග | පළල |
|---|---|---|---|---|---|---|
| 10. අප්පලාගොඩ පන්සල පාරේ සිට නිස්තේදෙණිය | අප්පලාගොඩ පන්සල | නිස්තේදෙණිය | 1. ටී.කේ හීන් අම්මා<br>2. ආර්. එම්. පුංචිබණ්ඩා<br>3. එස්. එම්. මනෝෂා උදයංගනී<br>4. එස්. එම්. ස්වර්ණලතා<br>5. එස්. එම්. සීලාවංශ<br>6. එස්. එම්. විජේසිංහ | 1. එස්. එම්. සීතා කුමාරි<br>2. එස්.එම්.<br>3. එස්. එම්. සීලවංශ<br>4. එස්. එම්. මහේෂා<br>5. එස්. එම්. විජේසිංහ | අඩි 550.0 | අඩි 10.0 |
| 11.ගංහත හන්දියේ සිට විල්පොල කුඹුර ඔස්සේ මානාගලවත්ත ප්‍රදේශයට යන අඩි පාර | ගංහත හන්දිය | මානාගලහේන මායිම | 1. අබයබණ්ඩා රත්නායක<br>2. ටී. එම්. සමරකෝන්<br>3. එස්. එම්. සෙනවිරත්න<br>4. එස්. එම්. සී. කේ. සමරකෝන්<br>5. එස්. එම්. වී. එන්. සමරකෝන්<br>6. ආර්. එම්. සීලවතී රත්නායක<br>7. ආර්. එම්. එල්. රත්නායක<br>8. කේ. එම්. අබේරත්න | 1. එස් එම්. එන්. බී. සමරකෝන්<br>2. එස්. එම්. පී. ඒ. සමරකෝන්<br>3. එස්. එම්. සෙනවිරත්න<br>4. එස්. එම්. සෙනවිරත්න<br>5. එස්. එම්. වී. එන්. සමරකෝන්<br>6. ආර්. එම්. සීලවතී රත්නායක<br>7. ආර්. එම්. එල්. රත්නායක<br>8. කේ. එම්. අබේරත්න | අඩි 355.00 | අඩි 6.00 |
| 12. හපුගස්කුඹුරට යන පාර | වැලිගල්ල-තලවත්ත පාර | හපුස්ගස්කුඹුර ඉඩම | 1. පොදු ඇළ | 1. ටී. ජී. අනුර ගමගේ | මීටර් 200.00 | අඩි 2.50 |
| 13. ගංහත-කළුවහල්කඩ පාරේ සිට වේගිරිය කන්ද දක්වා | කළුවහල්කඩ පාර | වේගිරිය කන්ද | 1. යූ. ඒ. ගාමිණී ජයතිස්ස<br>2. පද්මා මැණිකේ අමරකෝන් | 1. යූ. ඒ. ගාමිණී ජයතිස්ස<br>2. ආර්. එම්. බණ්ඩාර මැණිකේ | මීටර් 75.00 | අඩි 4.0 |
| 14. යාලේගොඩ විහාරයට යන පාර | මීවතුර, සඟබෝගම යාලේගොඩ පිලිගල්ල හරහා දවුලගල දක්වා පාර | යාලේගොඩ පුරාණ විහාරය දක්වා | 1. එගොඩගෙදරවත්ත<br>2. ආර්. නවරත්න<br>3. නිමල් ගුණරත්න<br>4. ගොඩබිත්තර පැල<br>5. රදාදෙණිය<br>6. ඩබ්. ඩබ්. එස්. දෙහිගම (පල්ලේකුඹුර) | 1. නවරත්න<br>2. ඩබ්. ඩබ්. චක්‍රබංඩාර<br>3. රත්නායක<br>4. ශ්‍රියානි දසනායක | අඩි 425.0 | අඩි 10.0 |
| 15. ඉඹුල්දෙණිය කපුකොටුව පාර | ඉඹුල්දෙණිය තිරිප්පුව මාර්ගයේ ගොවිජන සේවා මධ්‍යස්ථානය අසල | | ඩී. එම්. දර්ශන ඉන්ද්‍රජිත් ඉඹුල්දෙණිය | | අඩි 400.0 | අඩි 4.0 |
| 16. මල්වත්ත පාර | තිරිප්පුව ඉඹුල්දෙනිය පාර | | 1. එන්. ඩී. ඒ. කේ. වික්‍රමනායක<br>2. ඒ. ආර්. එම්. එස්. බංඩාර<br>3. ඩබ්. එම්. එස්. වීරකෝන්<br>4. ටී. කේ. නවරත්න | 1. එච් එම්. යූ. බී. හේරත් | මීටර් 190.0 | අඩි 10.0 |

10-883

---

**මාතර මහ නගර සභාව**

2011 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහා නගර සභා ආඥා පනත මගින් පැවරී ඇති බලතල අනුව මහ නගර සභා ආඥා පනතේ XII වැනි කොටසේ 230 වැනි වගන්තිය යටතේ මහ නගර සභා සීමාව තුළ 2011 වර්ෂය සඳහා වරිපනම් බදු 2000 වර්ෂයේ තක්සේරු

මත වෙළඳ හා වාණිජ්‍ය කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා 15%ක වරිපනම් බද්දක් ද අනෙකුත් දේපළ සඳහා 8% ක වරිපනම් බද්දක් ද, 2011 වර්ෂය සඳහා පනවා අයකිරීමට 2010.08.03 දින පැවැති මහ සභාව තීරණ අංක 06 :21 (අ) යටතේ ඒකමතිකව සම්මත කර ඇති බවත්, එය පහත ආකාරයට බදු අයකිරීමට තීරණය කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් මස 31 යන දිනයන්හි දී හෝ ඊට පෙර එම බද්ද සමාන කොටස් හතරකින් ගෙවා නිම කළ හැකි ය.

02. 2011 වර්ෂයට නියමිත බදු මුදල එම වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන්නේ නම් බදු මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ බදු මුදල් ඒ ඒ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවනු ලබන්නේ නම් සියයට පහක (5%) වට්ටමක් ද, ලැබීමට හිමිකම් ලැබේ.

03. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් දිනවලට පසුව කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඉඩම් හා වාසස්ථාන දේපළ වෙනුවෙන් සියයට පහළොවක (15%) අමතර ගාස්තුවක් ද, අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් ද, වරෙන්තු ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

ආර්. කේ. ආර්. ආර්. රණවීර,
නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2010 සැප්තැම්බර් මස 21 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-884

---

**ජාඇල නගර සභාව**

නගර සභා ආඥාපනත

**2011 වර්ෂය සඳහා දේපල බද්ද**

නගර සභා ආඥා පනත යටතේ (255) වැනි අධිකාරය 160(3) වගන්තිය ප්‍රකාර, ජාඇල නගර සභා සීමාව තුල 2011 වර්ෂයට පහත සඳහන් පරිදි වරිපනම් බදු පනවා අය කිරීමට ජාඇල නගර සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ජාඇල නගර සභා සීමාව තුළ තිබෙන සියළුම ව්‍යාපාරික ස්ථානවල වාර්ෂික වටිනාකමෙන් සියයට දොළහ (12%) බැගින් වූ දේපළ බද්දක් සහ

02. අනෙකුත් සියළුම නිශ්චල දේපළවල වටිනාකමෙන් සියයට තුන (3%) බැගින් දේපළ බද්දක් ද, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි අවසන් වන පරිදි සමාන කොටස් හතරකින් ගෙවිය යුතුවේ.

උපාලි අරඹවත්ත,
සභාපති,
නගර සභාව-ජාඇල.

2010 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජාඇල නගර සභා කාර්යාලයේ දී ය.

10-894/1

---

**ජාඇල නගර සභාව**

2011 වර්ෂය සඳහා වරිපනම් බදු පනවා අයකිරීම පිළිබඳව කෙරෙන නිවේදනය

01. ජාඇල නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි දේපළ වලින් 2011 වර්ෂය සඳහා වරිපනම් බදු පනවා අය කිරීමේ කාර්යය සඳහා සකස් කරන ලද වරිපනම් පොත් මහජනයාගේ දැනගැනීම පිණිස දැන් නගර සභා කාර්යාලයේ තබා ඇති බවත්, අදාල දේපළ හිමියන්ට පදිංචිකරුවන්ට, හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට ඒවා නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි බවත්, නගර සභා ආඥා පනතේ 160 හා 166 වැනි වගන්තිය සමග කියැවෙන මහ නගර සභා ආඥා පනතේ 235(1) හා (2) වගන්ති යටතේ මෙයින් නිවේදනය කරමි.

02. තවද සභා බල ප්‍රදේශය තුල පිහිටි සියළුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල වාර්ෂික වටිනාකමින් 12% (දොළහක) ප්‍රතිශතයක් හා අනෙකුත් සියළුම නිවාස හා සෑම අන්දමකින්ම විස්තර කෙරෙන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පංතිවල වාර්ෂික වටිනාකමින් 3% (තුනක) ප්‍රතිශතයක් වරිපනම් බදු ලෙස පනවා අය කිරීමට සභාව විසින් තීරණය කර ඇති බව ද නිවේදනය කරමි.

03. තවද 2011 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි හා සිව්වැනි කාර්තු වල වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර (අදාල වන පරිදි) ගෙවා අවසන් කළ යුතු බවත්, එසේ නොගෙවනු ලබන වරිපනම් බදු වෙනුවෙන් දේපලෙහි ස්වභාවය අනුව පිළිවෙලින් 20% ක (විස්සක) හා 15% (පහළොවක) අධි ගාස්තුවක් අයකරනු ලබන බවත් නිවේදනය කරමි.

04. තවද ගරු අමාත්‍යවරයා විසින් සම්පාදිත රෙගුලාසි අනුව, වාර්ෂික වරිපනම් බදු මුදල 2011.01.31 දින හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම් 10%ක (දහයක) වට්ටමක් සහ අර්ධ වාර්ෂිකව හෝ ත්‍රෛමාසිකව පළමු මස තුළදී ගෙවනු ලබන්නේ නම් 5% (පහක) වට්ටමක් ලබා දෙන බවත් මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

උපාලි අරඹවත්ත,
සභාපති,
නගර සභාව-ජාඇල.

2010 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජාඇල නගර සභා කාර්යාලයේ දී ය.

10-894/2

---

## ගලේවෙල ප්‍රාදේශීය සභාව

### වරිපනම් බද්ද - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(I) හා (II) වැනි වගන්ති ප්‍රකාර, ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටි දේපලවල වාර්ෂික වටිනාකමින් පහත උපලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වරිපනම් බද්දක් 2011 වර්ෂයට පනවා අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

| *ප්‍රදේශය* | *ගෘහස්ථ* | *වාණිජ* | *හිස් ඉඩම්* |
|---|---|---|---|
| මාතලේ පාර | 6% | 7% | 5% |
| කුරුණෑගල පාර | 6% | 7% | 5% |
| දඹුල්ල පාර | 6% | 7% | 5% |
| කලාවැව පාර | 6% | 7% | 5% |
| ජයතිලක මාවත | 6% | 7% | 5% |
| ධර්මපාල මාවත | 6% | 7% | 5% |
| ආනන්ද රාජකරුණා මාවත | 6% | 7% | 5% |
| බණ්ඩාරනායක මාවත | 6% | 7% | 5% |

02. තවද මෙකී පනතේ 134(7) වෙනි වගන්තියේ ප්‍රකාර වාර්ෂික බදු මුදල් සම්පූර්ණයෙන් ගෙවන අවස්ථාවේ දී පහත සඳහන් පරිදි වට්ටම් ප්‍රමාණයක් ප්‍රදානය කරන බව දැනුම් දෙමි. 2011 ජනවාරි 31 හෝ ඊට පෙර වර්ෂයට ගෙවිය යුතු මුළු වරිපනම් බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10% ක වට්ටමක් ද, බදු මුදල එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත් හෝ එසේ ගෙවන එම මුදලින් 05% ක වට්ටමක් ද දෙනු ලැබේ.

03. ඉහත කී පරිදි පනවන ලද වරිපනම් බද්ද නොගෙවන අයගෙන් අයවිය යුතු හිඟ මුදල් අනුව ව්‍යාපාරික දේපලක් වෙනුවෙන් 20% හෝ අනිත් සෑම දේපලක් සඳහා 15%ක වූ වරෙන්තු ගාස්තුවක් එකී ප්‍රාදේශීය සභා පනතේ 161 වැනි වගන්තියේ (අ) යටතේ අය කරන බවද, හිඟ බදු මුදල් නොගෙවීමේ හේතුව මත දේපල තහනමට ගන්නා අවස්ථාවක එහි 161 (ආ), (ඇ), (ඉ) සහ (ඊ) වගන්ති ප්‍රකාර අදාල ගාස්තු ගෙවිය යුතු බවට ද මෙයින් නිවේදනය කරමි.

ඇම්. පී. ආර්. ජයතිලක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ගලේවෙල.

2010 ඔක්තෝබර් මස 07 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-866/1

---

## මාතර මහ නගර සභාව

### 2011 අයවැය ලේඛනය

2011 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුලත් වැඩ සටහන් අයවැය ලේඛනය මාතර මහ නගර සභා කාර්යාල පරිශ්‍රයේදී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2010.10.28 දින සිට දින හතක කාලයක් විවෘතව තබන බව මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 212(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ඩබ්. උපුල් නිශාන්ත,
නගරාධිපති,
මාතර මහ නගර සභාව.

2010 ඔක්තෝබර් මස 06 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-970

**නුවරඑළිය මහ නගර සභාව**

ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ අනුමත කර ඇත්තාවූ හෝ අනුමත කර ඇති හෝටල් වලින් බදු අයකිරීම - 2011 වර්ෂය

නුවරඑළිය මහ නගර සභා පාලන සීමාව තුළ යම් හෝටලයක්, ආපන ශාලාවක්, හෝ ලැගුම්හලක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූ ද, ඒ හෝටලය, ආපන ශාලාව, ලැගුම්හල (1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ අවස්ථාවක එම හෝටලයේ , ආපන ශාලාවේ හෝ ලැගුම්හලේ එම වර්ෂයට පෙරාතුව වූ වර්ෂ සඳහා වූ ලැබීම් වලට අනුකූලව එම ලැබීම් වලින් 0.25% මුදලක් බලපත්‍ර ගාස්තුව ලෙස එම හෝටලය, ආපන ශාලාව, ලැගුම්හල පවත්වාගෙන යන අය විසින් ගෙවිය යුතුය.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
මහනගර සභාව,
නුවරඑළිය.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-967/1

---

**මහරගම නගර සභාව**

2011 වර්ෂය සඳහා වරිපනම් බදු

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තිය ප්‍රකාර ඒ ඒ සීමා කිරීම් කොන්දේසි හා නිදහස් කිරීම් වලට යටත්ව මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි වූ වරිපනම් බද්දක් 2011 වර්ෂය වෙනුවෙන් මහරගම නගර සභාව විසින් පනවා අයකරනු ලබන බවත්, එකී බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී ඊට ප්‍රථම සමාන කොටස් හතරකින් හෝ සම්පූර්ණයෙන්ම හෝ ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| (අ) | මහරගම නගර සභා බල ප්‍රදේශයේ මුඩු ඉඩම් හා නේවාසික දේපල සඳහා | තක්සේරුගත වාර්ෂික වටිනාකමින් 7% (සියයට හතයි) |
| (ආ) | මහරගම නගර සභා බල ප්‍රදේශයේ වාණිජ දේපල සඳහා | තක්සේරුගත වාර්ෂික වටිනාකමින් 10% (සියයට දහයයි) |

02. 2011 වර්ෂයට නියමිත සම්පූර්ණ වරිපනම් බදු මුදල් එම වර්ෂයේ ජනවාරි මස 31 දින හෝ ඊට පෙර ගෙවා අවසන් කරන්නේ නම් එම බදු මුදලින් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට නියමිත බදු මුදල අදාල කාර්තුවේ පළමු මාස තුළ ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් දෙනු ලැබේ.

03. ඉහත පළමුවන ඡේදයේ සඳහන් දිනයන්ට ප්‍රථම මුදල් නොගෙවන ස්ථාන වෙනුවෙන් සෑම කාර්තුවක් අවසානයේ දී මුඩු ඉඩම් හා නේවාසික ස්ථාන සඳහා ගෙවනු ලැබිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් 15% (සියයට පහළොවක්) සහ වාණිජ දේපල වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් 20% (සියයට විස්සක්) වරෙන්තු ගාස්තුවක් අයකරනු ලැබේ.

කාන්ති කොඩිකාර,
සභාපතිනි,
මහරගම නගර සභාව.

2010 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

10-1027

---

**නුවරඑළිය මහ නගර සභාව**

දේපළ වරිපනම් බද්ද - 2011 වර්ෂය

1942 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 230 වැනි වගන්තිය යටතේ සහ එහි අන්තර්ගත විධිවිධානයන්ට අනුකූලව නුවරඑළිය මහ නගර සීමාව තුළ පිහිටි සියලුම නිශ්චල දේපළ වල වටිනාකම මත පහත සඳහන් පරිදි වරිපනම් බද්දක් 2011 වර්ෂය සඳහා අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | *2010* | *2011* |
|---|---|---|---|
| 01. | නේවාසික ස්ථාන, හිස් බිම්, මුඩු බිම් සඳහා එම දේපළවල වාර්ෂික වටිනාකමින් | 10% | 10% |
| 02. | වාණිජ හා අනෙකුත් දේපලවල වාර්ෂික වටිනාකම | 14% | 14% |

ඉහත දැක්වෙන සියලුම දේපළ වරිපනම් බදු සමාන වාරික 04කින් එනම්, 2011 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලදී හෝ ඊට පෙර ගෙවා අවසන් කළ යුතු වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
නුවරඑළිය මහ නගර සභාව.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-967/2

# විවිධ දැන්වීම්

## නුවරඑළිය මහ නගර සභාව

### විනෝද බද්ද - 2011 වර්ෂය

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත (176 අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ සෑම චිත්‍රපටි දර්ශනයක්, සැණකෙළියක්, මුදල් අයකරනු ලබන සෑම දර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට විසිපහක (25%) විනෝද බද්දක් ගෙවිය යුතු අතර, ඒ වෙනුවෙන් පහත සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතුය :-

| | | රු. ශත |
|---|---|---|
| 01. | එක් දිනයක් සඳහා සංගීත සංදර්ශනයක්, චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් වෙනුවෙන් | 500 0 |
| 02. | එක් දිනකට වැඩි වන අමතර එක් දිනකට | 100 0 |

ජේ. එම්. ජේ. කේ ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
නුවරඑළිය.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-967/4

## නුවරඑළිය මහ නගර සභාව

### ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2011 වර්ෂය

මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 272/27 උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව, 1989.01.20 වැනි දින අංක 541/17 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කොට ඇති 90/ඒ පිටුවේ (02 කොටස) ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශ සීමාව තුළ කිසියම් තැනැත්තකු විසින් යම් ලෙසකට පාරකට, ඇළකට හෝ වැවකට පෙනෙන සේ කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා නාගරික කොමසාරිස්වරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු වන අතර, ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2011 වර්ෂයේ සිට අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජේ. එම්. ජේ. කේ ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
නුවරඑළිය.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම එක් වර්ෂයක් හෝ ඉන් කොටසකට (පුවරුවේ දෙපැත්තම ප්‍රදර්ශනය වන්නේ නම්, ගාස්තු දෙපැත්තටම අයකළ යුතුයි.) | රු. 250 0 |

| | | |
|---|---|---|
| 02. | බැනරයක් මත ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම එක් මසකට හෝ ඉන් කොටසකට | රු. 50 0 |
| 03. | ලෑල්ලක් මත හෝ ආධාරකයක් මත ප්‍රදර්ශනය කරනු ලබන විදුලි ආලෝක සහිත දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම එක් වර්ෂයක් හෝ ඉන් කොටසක් සඳහා | රු. 500 0 |
| 04. | බිත්තියක්, පුවරුවක් හෝ ලෑල්ලක් මත ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම එක් මසකට හෝ ඉන් කොටසකට | රු. 10 0 |

10-967/3

---

**නුවරඑළිය මහ නගර සභාව**

මහ නගර සභා ආඥාපනත (252 වැනි අධිකාරය)

මහ නගර සභා ආඥාපනතේ හෝ එම පනත යටතේ පවත්වන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර බලපත්‍ර නිකුත් කිරීමේ දී මහ නගර සභා (සංශෝධිත) පනතේ 247 (ආ) වැනි වගන්තිය අනුව, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර සඳහා 2011 ජනවාරි මස 01 වැනි දින සිට සංශෝධිත පනතට යටත්ව ඉදිරියට බල පැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර හා එයට අදාළ එකතු කිරීමේ අගය මත බදු (වැට් බද්ද) අය කිරීමට තීරණ අංක 04-111-47 යටතේ තීරණය කළ බවයි. සියළුම බලපත්‍ර ගාස්තු 2011 වර්ෂයේ මාර්තු මස 31 දිනට ප්‍රථම ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
නුවරඑළිය මහ නගර සභාව.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

01. මහ නගර සභා ආඥාපනතේ 247(අ) යටතේ ගැනෙන අප්‍රිය හා අන්තරාදායක ව්‍යාපාර සඳහා බලපත්‍ර ගාස්තු වාර්ෂික තක්සේරුව පරිදි 2011 වර්ෂයට ගෙවිය යුතු ය.
02. මහ නගර සභා ආඥාපනතේ 247 (ආ) යටතේ ගැනෙන වෙළඳාම් බද්ද 2011 වර්ෂයට ගෙවිය යුතු ය.
03. මහ නගර සභා ආඥාපනතේ 247(ඇ) යටතේ ව්‍යාපාර විෂයෙහි බදු 2011 වර්ෂයට ගෙවිය යුතු ය.
04. සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ පිළිගනු ලැබ ඇති හෝටල් හෝ ආපනශාලා හෝ නවාතැන්වලින් එම ව්‍යාපාරයෙන් පසුගිය වර්ෂයේ ලැබීම් මත සියයට දශම දෙකයි පහක (0.25%) බද්දක් ගෙවිය යුතු ය.
05. තක්සේරු නොකරන ලද ස්ථානයක් වෙනුවෙන් මහ නගර සභාවේ ආදායම් පරීක්ෂක විසින් කරනු ලබන තාවකාලික තක්සේරුව මත බලපත්‍ර ගාස්තුව/ බද්ද ගෙවිය යුතු ය.
06. එකම වරිපනම් අංකයක් යටතේ කර්මාන්ත (ව්‍යාපාර එකකට වැඩි ගණනක්) පවත්වාගෙන යන්නේ නම්, අදාළ එක් එක් කර්මාන්තයක් (ව්‍යාපාරයක්) කාර්යයන් සඳහා යොදවන ලද ස්ථානයෙහි , බිම් ප්‍රමාණයෙහි කොටස් කළ වාර්ෂික වටිනාකම පදනම් කොට ඒ ගාස්තු හෝ ඒ බද්ද තීරණය කරනු ලබන අතර, ඒ අනුව, නියම කරන බදු ගෙවිය යුතු ය.

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි නොවන විට රු. ශ.* | *වාර්ෂික වටිනාකම රු.2,500 ට වැඩි නොවන විට රු. ශ.* | *වාර්ෂික වටිනාකම රු. 2,500 ට වැඩි වන විට රු. ශ.* |
|---|---|---|---|---|
| 01. | බේකරියක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 02. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 03. | තේ කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 5,000 0 |
| 04. | බේකරි නිෂ්පාදන අලෙවි සැලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 5,000 0 |
| 05. | ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 5,000 0 |
| 06. | රසකැවිලි නිෂ්පාදන අලෙවි සැලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 5,000 0 |
| 07. | අයිස්ක්‍රීම්, යෝගට්, කිරි වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 1,000 0 | 3,000 0 | 5,000 0 |
| 08. | අයිස්ක්‍රීම්, යෝගට්, කිරි නිෂ්පාදන අලෙවිසැලක් පවත්වාගෙන යාම | 1,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි නොවන විට රු. ශ. | වාර්ෂික වටිනාකම රු.2,500 ට වැඩි නොවන විට රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 2,500 ට වැඩි වන විට රු. ශ. |
| රු. 1,50,001 ට වැඩි | 3,000 |

*(7) සංවර්ධනය නොකළ ඉඩම් මත බදු - 153 වගන්තිය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) ඡේදය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුලත්සිංහල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් මත පහත දැක්වෙන ආකාරයේ වාර්ෂික බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අයකරනු ලැබේ.

ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය එකී සංවර්ධනය නොකළ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට එකක් (1%) විය යුතු ය. මේ බද්ද අයකිරීම සඳහා එකී පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" යන්නෙන් යම් ඉඩමක සම්පූර්ණ ඉඩමේ බිම් ප්‍රමාණය, එම ඉඩමේ ගොඩනැගිලිවලින් හෝ ස්ථිර නැතහොත් නිරන්තර වගාවකින් ආවරණය වූ බිම් ප්‍රමාණය අතර අනුපාතය 2:1 ක් විය යුතු බවට හා ඊට අඩු සමානුපාතයක් සහිත යම් ඉඩමක් සංවර්ධනය නොකළ ඉඩමක් යනුවෙන් ද සලකනු ලැබේ.

මෙකී වාර්ෂික බද්ද 2011 මාර්තු මස 31 වැනි දිනට පෙර බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ය.

*(8) විනෝද බදු/අනියම් විනෝද දර්ශන*

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය ඇතුළත, මුදල් අයකර පෙන්වනු ලබන, චිත්‍රපටි දර්ශන, සංගීත ප්‍රසංග, නාට්‍ය, මැජික් දර්ශන, සර්කස් දර්ශන රජයේ අනුමත වීඩියෝ දර්ශන යනාදී ඕනෑම දර්ශනයක් නැරඹීම සඳහා ප්‍රේක්ෂකයින් වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට එම දර්ශනය පෙන්වනු ලබන්නා විසින් ගෙවනු ලැබිය යුතු ය. පුන්‍ය කටයුතු හෝ පොදු සංවර්ධන කටයුතු සඳහා පෙන්වනු ලබන දර්ශන පිළිගත හැකි සාක්ෂිමත බද්දෙන් නිදහස් කරනු ලැබේ.

*(9) ඉඩම් විකිණීම මත බදු - 154 වගන්තිය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

*(10) ප්‍රචාරක දැන්වීම් (දෘශ්‍ය පරිසරය)*

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තිය යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දාවූ ද 1989.12.05 දිනැති අංක 209 තීරණය මගින් බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් පිළිගනු ලැබ 1990.02.08 දිනැති අංක 597 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දාවූ ද සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 39 දරන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 3 (උ) වගන්තියට අනුව මෙහි පහත අංක 05 උපලේඛනයේ (i) කොටසේ සඳහන් ගාස්තු පනවා අයකළ යුතු බවත්, එකී අතුරු ව්‍යවස්ථාවේ 10 වැනි වගන්තියේ කාර්යයන් සඳහා අංක 05 උපලේඛනයේ (ii) කොටසේ සීමාවන් නියම කළ යුතු බවත් 2009 නොවැම්බර් මස 19 දිනැති අංක 06.i.a දරන බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මහ සභා තීරණය අනුව මෙයින් නිවේදනය කරමි.

**අංක 05 වැනි උපලේඛනය**

*(i) කොටස*

*බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරන ගාස්තු :*

*(අ)* තාවකාලික බැනරයක්/පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා (එක් මාසයක් සඳහා වර්ග අඩියකට) රු. 25 0

*(ආ)* ස්ථිර දැන්වීමක්/පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා (එක් වර්ෂයක් සඳහා වර්ග අඩියකට) රු. 75 0

*(ii) කොටස*

*ප්‍රචාරක දැන්වීම් හා පුවරු ප්‍රදර්ශනය සීමාකර ඇති ප්‍රදේශ :*

*(අ)* බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත

11. *අයාලේ යන ගවයන් පිළිබඳ නිවේදනය - 66 වගන්තිය*

බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රසිද්ධ මංමාවත්වල අයාලේ යන ගවයන්ගෙන් ප්‍රදේශයේ මහජනතාවට විවිධ දේපළ හානි හා ආපදාවන් සිදුවන බැවින් ඒවා වැලැක්වීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 (1), (2), (3) වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමටත් ඒ සඳහා අංක 06 උපලේඛනයේ සඳහන් ගාස්තු අයකිරීමටත් 2009 නොවැම්බර් මස 19 වැනි දින අංක 06.i.a දරන බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මහා සභා තීරණය අනුව මෙයින් නිවේදනය කරමි.

**අංක 06 වැනි උපලේඛනය**

*(අ)* අයාලේ යන එක් ගවයෙකු සඳහා එක් දිනකට රු. 500

*(ආ)* වැඩිවන සෑම දිනකටම රු. 100 බැගින්

*(ඇ)* අල්ලන ගවයෙකු දින 5 ක් ඇතුළත අයිතිකරු විසින් නිදහස් කර ගනු නොලැබුවහොත් සභාව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් සභා අරමුදලට යොදවනු ලැබේ.

12. *මෝටර් වාහන නැවතුම්පල බලපත්‍ර - 2011*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 122 වැනි වගන්තිය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන නීතිය හා සාමය, පළාත් පාලනය, පළාත් පරිපාලනය, අධ්‍යාපන, ප්‍රවාහන, රැකීරක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය වන මවිසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව අනුව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් එම බල ප්‍රදේශයේ අනුමත කරන ලද මෝටර් වාහන නැවතුම්පල ස්ථානවල මෝටර් වාහන නවතා තැබීම වෙනුවෙන් පහත 07 වැනි උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු ගෙවා 2011 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම බලපත්‍රය ලබා ගත යුතු ය. ඉන්පසු අළුතින්ම ඇතුළත් කරන ත්‍රිරෝද රථ නැවතුම්පලට ඇතුළත් කිරීමට ප්‍රථම අදාළ බලපත්‍රය ලබාගත යුතු ය.

**අංක 07 වැනි උපලේඛනය**

| | *වාර්ෂික අවසර පත්‍ර සඳහා ගාස්තුව* | *රු. ශත* |
|---|---|---|
| *(අ)* | ලොරියක් හෝ පුද්ගලික බස් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | 500 0 |
| *(ආ)* | ටැක්සි රථයක් හෝ වෙනත් මෝටර් රථයක් සඳහා | 300 0 |
| *(ඇ)* | ත්‍රිරෝද රථයක් සඳහා | 250 0 |
| *(ඈ)* | මෝටර් බයිසිකලයක් සඳහා | 100 0 |

10-997

---

**මාවතගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ බලපත්‍ර ගාස්තු හා බදු ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150, 151 සහ 152(1) වැනි වගන්ති ප්‍රකාර මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් I, II, III උපලේඛනවල දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ද, කර්මාන්ත විෂයයෙහි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බද්දක් ද, ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ වෙළෙඳ ව්‍යාපාරයේ ආදායම මත පදනම් වූ වර්ෂික බද්දක් ද මීට පෙර වර්ෂවල මෙන්ම 2011 වර්ෂයට පනවා අය කිරීමට 2010 සැප්තැම්බර් මස 30 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී අංක 7:1:2 යෝජනාව අනුව තීරණය කරන ලද බව ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඒ අනුව මෙකී වාර්ෂික බදු මුදල් 2011 මාර්තු මස 31 වැනි දින හෝ එදිනට පෙර මාවතගම ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ය.

එච්. එස්. කේ. බී. මීගොල්ල,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව - මාවතගම.

2010 සැප්තැම්බර් මස 30 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## උපලේඛනය අංක I

| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.1 සිට රු. 750 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ. |
|---|---|---|---|---|
| | *අනතුරුදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත :* | | | |
| 1. | බේකරියක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| 2. | බත් කඩයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 1,000 0 |
| 3. | මාළු විකිණීම පිණිස පෞද්ගලික වෙළඳපොලක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 4. | මස් විකිණීම පිණිස පෞද්ගලික වෙළඳ පොලක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 650 0 | 1,000 0 |
| 5. | වී මෝලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 6. | කම්හලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 7. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | යන්ත්‍රානුසාරයෙන් කුළු බඩු හෝ පිටි ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | - | - |
| 9. | තෙල්වලින් හෝ වෙනත් දැවෙන ද්‍රව්‍යවලින් වාෂ්ප හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන ව්‍යාපාරයක් හෝ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කඹ ඇඹරීම හෝ ලණු ගෝනි නිපදවීමේ ස්ථානයක් යන්ත්‍රානුසාරයෙන් හෝ අන් ලෙසකින් පැවැත්වීම | 300 0 | 500 0 | 1,000 0 |
| 11. | ඉලෙක්ට්‍රික් වැඩපලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 12. | අම්ලකර වායුවෙන් පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 13. | කරවල හෝ ජාඩි ගබඩා කිරීම හෝ විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 14. | නරක්වන සුලු ආහාර ද්‍රව්‍ය හෝ සිල්ලර බඩු ගබඩා කිරීම හෝ විකිණීම | | | |
| | (i) තොග | 300 0 | 500 0 | 1,000 0 |
| | (ii) සිල්ලර | 300 0 | 500 0 | 1,000 0 |
| 15. | කෘත්‍රිම පොහොර හෝ පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය මාස 03 ට වඩා ගබඩා කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 16. | අඟුරු ලබාගැනීම සඳහා පොල්කටු පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 17. | රස කැවිලි සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 18. | කොහු හෝ කෙඳි වර්ග සායම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 19. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 20. | හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම හෝ සකස් කිරීම හෝ විකිණීම/හුණු පෝරණුව | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 22. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | සිල්ක් හෝ කෘත්‍රිම රෙදි විසිතුරු කිරීම (බතික්) | 300 0 | 500 0 | 1,000 0 |
| 24. | කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 25. | විකිණීම පිණිස මාළු වර්ග හෝ මස් වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | විදුලි බලයෙන් හෝ කාබයිට් උපයෝගී කරගෙන පෑස්සුම් වැඩපලක් පැවැත්වීම | 300 0 | 500 0 | 1,000 0 |
| 27. | විදුලි බලයෙන් හෝ අත්යන්ත්‍ර මගින් ගෝස් වර්ග හෝ බැන්ඩේජ් නිෂ්පාදනය කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 28. | යන්ත්‍රානුසාරයෙන් කොහු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | රබර් ආශ්‍රිතව කරන භාණ්ඩ නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | යන්ත්‍රානුසාරයෙන් වඩුමඩුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | කුකුළන් 100 ට අඩු කොටුවක් තබා ගැනීම | 300 0 | 400 0 | 1,000 0 |
| 32. | කුකුළන් 100 ත් 5,000 ත් අතර කොටුවක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | මාළු හෝ මස් ජාඩි දැමීම, වේළීම හෝ අයිස් දැමීම | 300 0 | 500 0 | 1,000 0 |
| 34. | අලවන ද්‍රව්‍ය (ගම්) නිෂ්පාදනය හෝ විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 35. | ඇසිඩ් වර්ග විකිණීම හෝ ගබඩා කර තබා ගැනීම | 300 0 | 500 0 | 1,000 0 |
| 36. | එල්. පී. ගෑස් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 40. | රබර් රෝලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 41. | මිනිරන් සකස් කිරීම සහ වර්ග කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 42. | ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 43. | පොල් තෙල් සිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | මිරිස් තුනපහ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.1 සිට රු. 750 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ |
|---|---|---|---|---|
| 46. | තේ කුඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | සබන් වර්ග හා සුවඳ විලවුන් නිෂ්පාදනය | 300 0 | 500 0 | 1,000 0 |
| 48. | හඳුන්කූරු, මදුරු දඟර සුවඳ ධූප නිෂ්පාදනය | 300 0 | 500 0 | 1,000 0 |
| 49. | කිරි හට්ටි නිෂ්පාදනය හා අලෙවිය | 300 0 | 500 0 | 1,000 0 |
| 50. | දැව පදම් කිරීම/ තුනී ලෑලි නිෂ්පාදන කටයුතු | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛනය අංක 02**

***ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය අනුව ව්‍යාපාර බදු අය කරනු ලබන ව්‍යාපාර***

| | | | | |
|---|---|---|---|---|
| 1. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 2. | ලැගුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම (සැලුන්) | 300 0 | 500 0 | 1,000 0 |
| 4. | පෞද්ගලික වෙළඳපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ස්වර්ණාභරණ සෑදීම | 300 0 | 500 0 | 1,000 0 |
| 6. | කුලියට වී කෙටීම | 300 0 | 500 0 | 1,000 0 |
| 7. | විකිණීම සඳහා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | යන්ත්‍රානුසාරයෙන් කුළු බඩු හෝ පිටි ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 9. | තෙල්වලින් හෝ වෙනත් දැවෙන ද්‍රව්‍යවලින් වාෂ්ප හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන ව්‍යාපාරයක් හෝ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොහු හෝ පොල් කෙඳි හෝ ඉන් තැනූ භාණ්ඩ ගබඩා කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ටයර්, ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/වින්කලයක් | 300 0 | 500 0 | 1,000 0 |
| 12. | අතින් ලී ඉරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 13. | රබර් ගබඩාවක් තබා ගැනීම (මිළට ගැනීම /විකිණීම) | 300 0 | 500 0 | 1,000 0 |
| 14. | සිසිල් බීම ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (අලෙවි නියෝජිත) | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 16. | දර ගබඩා කිරීම හෝ විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 17. | ඉරාපු ලී ගබඩා කිරීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 300 0 | 500 0 | 1,000 0 |
| 20. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු, සීනි සහ සහල් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | අලුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයකින් රෙදි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටැම්පර්, සායම් වර්ග ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම | 400 0 | 600 0 | 1,000 0 |
| 25. | සිමෙන්ති, ඇස්බැස්ටෝස් භාණ්ඩ නිපදවීම හෝ විකිණීම/ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ඉංග්‍රීසි බෙහෙත් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාමසියක්) | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 28. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී හෝ ඔර්ලෝසු අළුත්වැඩියා කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 29. | යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මෝටර් සයිකල්) | 300 0 | 500 0 | 1,000 0 |
| 30. | සිමෙන්ති, ගඩොල් හෝ කොන්ක්‍රීට් කණු හෝ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් ගබඩා කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 32. | උත්සව කටයුතු සඳහා ටෙන්ට්, පුටු, මේස හෝ පිඟන් භාණ්ඩ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 33. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 34. | එළවළු හෝ පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 35. | පාවහන් විකිණීමේ හෝ සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | රෙදි බතික් කිරීමේ වැඩපලක් හෝ රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 37. | රබර් ආශ්‍රිතව නිෂ්පාදනයවන භාණ්ඩ පැකට් කිරීමේ හෝ සැකසීමේ කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |

| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.1 සිට රු. 750 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ |
|---|---|---|---|---|
| 38. | යෝගට් නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 39. | අළුත් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 1,000 0 |
| 40. | රබර් ගබඩා කිරීමේ හෝ මිළට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 41. | රබර් සෙරෙප්පු හෝ සපත්තු සඳහා පටි කැපීමේ හෝ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 42. | අළුත් හෝ නැවත පුරවන ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | කුෂන් කිරීමේ ස්ථානයක් හෝ ඇපොස්තින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 44. | කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම | 300 0 | 500 0 | 1,000 0 |
| 45. | ස්වර්ණාභරණ ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | යන්ත්‍රානුසාරයෙන් මුද්‍රණාලයක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | අතින් ක්‍රියා කරන මුද්‍රණාලයක් තබා ගැනීම | 300 0 | 500 0 | 1,000 0 |
| 48. | පොල් ලෙලි පෙඟවීම සඳහා කොටුවක් තබා ගැනීම (බඹයක් හෝ ඉන් කොටසක්) | 300 0 | 500 0 | 1,000 0 |
| 49. | යකඩ බඩු හෝ ගොඩනැගිලි උපකරණ ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම (හාඩ්වෙයාර්) | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | අවමංගල භාණ්ඩ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 52. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 53. | එළවළු තෙල් වර්ග ගබඩා කර තබා ගැනීම | 300 0 | 500 0 | 1,000 0 |
| 54. | පොල් තෙල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම (ගැලුම් 45 ට වැඩි) | 300 0 | 500 0 | 1,000 0 |
| 55. | ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | විසිරි පින්තාරු කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 57. | අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයකින් නූල් කැටීම, විවීම | 300 0 | 500 0 | 1,000 0 |
| 58. | මැසූ ඇඳුම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම | 300 0 | 500 0 | 1,000 0 |
| 60. | පොල් ලී මඩුවක් තබා ගැනීම, විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | සිමෙන්ති හොන්ඩර 25 ට වැඩියෙන් ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම, විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 63. | පුන්නක්කු හොණ්ඩර 01 ට වැඩියෙන් ගබඩා කර තබා ගැනීම | 300 0 | 500 0 | 1,000 0 |
| 64. | කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම හෝ විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 66. | දේශීය බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 67. | ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | අළුත් හෝ පරණ යකඩ ගබඩා කර තබා ගැනීම විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ටේලර් සාප්පුවක්) | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | විදුලි උපකරණ හෝ එම අමතර කොටස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | පොල් සිල්ලර වශයෙන් ලෙලි කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 73. | වාත්තු වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | පිත්තල භාණ්ඩ විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 76. | රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | පැරණි කෞතුක භාණ්ඩ එක්රැස් කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | සබන්, පවුඩර්, සුවඳ විලවුන් හෝ සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | පොත්පත්, පුවත්පත් හෝ ලිපි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | ඡායා පිටපත්, රෝණියෝ පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 81. | රේස් ඔට්ටු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | මෙරට හෝ රට බීම සිල්ලරට විකිණීමේ ස්ථානයක් පැවැත්වීම (සංචාරක හෝටල් හා ලැගුම්හල් ඇතුළුව) | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | විසිතුරු භාණ්ඩ හෝ ලීවලින් නිම කළ සත්ත්ව භාණ්ඩ, සත්ත්ව රූප හෝ වෙස් මුහුණු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 84. | මහන මැෂින් හෝ පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 85. | ග්‍රොසරියක් හෝ ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 1,000 0 |
| 86. | සංචාරකයින් සඳහා හෝටලයක් හෝ නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම (1968 අංක 15 දරන සංචාරක සංවර්ධන පනත ප්‍රකාර පසුගිය වර්ෂයේ ලැබීම් මත 1% ක් අය විය යුතු යි) | 500 0 | 750 0 | 1,000 0 |

| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.1 සිට රු. 750 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ |
|---|---|---|---|---|
| 87. | පිඟන් බඩු හෝ වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම (තැගි භාණ්ඩ) | 300 0 | 500 0 | 1,000 0 |
| 88. | ප්ලාස්ටික් හෝ ඇලුමිනියම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 1,000 0 |
| 89. | පාපැදි, ත්‍රීවීල් හෝ යතුරුපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 1,000 0 |
| 90. | ගීත පටිගත කිරීමේ හෝ ගීත පටි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 91. | ශබ්ද විකාශන යන්ත්‍ර බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 92. | වීඩියෝ කැසට් පටි සීඩී, වීසීඩී, ඩීවීඩී පට බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 93. | ඇළුමිනියම් පටි ආධාරයෙන් ෂෝකේස් හා අනෙකුත් නිෂ්පාදනය කිරීම හෝ විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 94. | රේඩියෝ කැසට් යන්ත්‍ර හෝ රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 750 0 | 1,000 0 |
| 96. | ශීතකරණ හෝ අධිශීතකරණ විකිණීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | සංචාරක වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 98. | ප්‍රචාරක හා නාමපුවරු ඇඳීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | ඇළුමිනියම් හා වීදුරු උපයෝගී කර භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 100. | වැලි ගඩොල් විකිණීම සහ ප්‍රවාහනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | පැල තවානක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 102. | සිගරට්, බීඩි, සුරුට්ටු තොග වශයෙන් විකිණීම, බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 103. | දේශීය ද්‍රව්‍ය මිලදී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 104. | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 300 0 | 500 0 | 1,000 0 |
| 105. | විසිතුරු මසුන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 106. | බොරළු හැරීම | 300 0 | 600 0 | 1,000 0 |
| 107. | බීඩි නිෂ්පාදනය | 300 0 | 500 0 | 1,000 0 |
| 108. | සුරුට්ටු නිෂ්පාදනය | 300 0 | 500 0 | 1,000 0 |
| 109. | දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 110. | මැටි භාණ්ඩ ගබඩා කිරීම හා විකිණීම | 300 0 | 500 0 | 1,000 0 |
| 111. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිය | 300 0 | 500 0 | 1,000 0 |
| 112. | මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 113. | පෞද්ගලික දුරකථන ඇමතුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 114. | වාහන අමතර කොටස් වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 115. | වතුර බෝතල් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 116. | සිංහල බෙහෙත් වෙළඳසැලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 117. | පරණ බඩු/යකඩ බඩු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 118. | වීදුරු භාණ්ඩ, වීදුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 119. | ඇස් පරීක්ෂා කිරීම හා ඇස් කණ්ණාඩි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 120. | ජංගම දුරකථන අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 121. | ජංගම දුරකථන අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 122. | කුළු බඩු වර්ග පැකට් කර අලෙවිය (ජංගම) | 300 0 | 500 0 | 1,000 0 |
| 123. | ඖෂධ තෙල් වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 300 0 | 500 0 | 1,000 0 |
| 124. | වෙළඳ භාණ්ඩ බෙදා හැරීම (ජංගම) | 500 0 | 750 0 | 1,000 0 |
| 125. | පොල් තොග අලෙවි කිරීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 126. | ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 127. | වී මිලට ගැනීම , ගබඩා කර තබා ගැනීම අලෙවිය සහ හාල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 128. | හඳුන්කූරු, මදුරු දඟර, සුවඳ ධූප අලෙවිය | 300 0 | 500 0 | 1,000 0 |
| 129. | ආහාරපාන සැපයීම (කේටරින්) | 500 0 | 750 0 | 1,000 0 |
| 130. | විද්‍යුත්, ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 131. | මදුරු දැල් නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 132. | ඇන්ටෙනා නිෂ්පාදනය හා අලෙවිය | 300 0 | 500 0 | 1,000 0 |
| 133. | බිම්මල් වගාව, බෙදා හැරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 134. | කිරි ශීත කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 135. | සිසිල් බීම, පානීය ජල බෝතල් බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 136. | පරිගණක ලිපි සැපයීම | 300 0 | 500 0 | 1,000 0 |
| 137. | පරිගණක ක්‍රීඩා සැපයීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 138. | පරිගණක උපාංග අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 139. | ලී වලින් බීරළු කැපීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 140. | උළු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |

## උපලේඛනය III

*ප්‍රාදේශීය සභා පනතේ 152(1) වැනි වගන්තිය අනුව ව්‍යාපාර බදු අය කරනු ලබන ව්‍යාපාර*

| *තක්සේරු මුදල* | *වාර්ෂික තක්සේරුව රු. ශත* |
|---|---|
| රුපියල් 6,000 ට අඩු නම් බදු අය නොකෙරේ | - |
| රුපියල් 6,000 සිට රු. 12,000 දක්වා | 90 0 |
| රුපියල් 12,001 සිට රු. 18,750 දක්වා | 180 0 |
| රුපියල් 18,751 සිට රු. 75,000 දක්වා | 360 0 |
| රුපියල් 75,001 සිට රු. 1,50,000 දක්වා | 1,200 0 |
| රුපියල් 1,50,001 සිට ඉහළට | 3,000 0 |

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්වරුන්
04. මුදල් ආයෝජකයන්
05. උකස් බඩු ගන්නවුන්
06. කොන්ත්‍රාත්කරුවන්
07. සැපයුම්කරුවන්
08. රියැදුරු පුහුණු ආයතන
09. ලොතරැයි නියෝජිතයින්
10. මෝටර් බයිසිකල් වෙළඳ ආයතන
11. රක්ෂණ නියෝජිත ආයතන
12. සැහැල්ලු වාහන විකිණීම හා කුලියට ලබාදෙනු ලබන ආයතන
13. බර වාහන හා ඉඩම්, වාහන විකිණීම හා කුලියට දෙන ආයතන
14. මැණික් වෙළඳ ව්‍යාපාරික ආයතන
15. පෞද්ගලික අධ්‍යාපන සපයන ආයතන
16. රැකියා ඒජන්සිකරුවන්
17. මූල්‍ය ආයතන හා බැංකු
18. නොතාරිස්වරු හා නීතිඥවරු
19. රක්ෂණ සමාගම්
20. ඒජන්සිකරුවන් මාර්ගයෙන් බඩු විකිණීම
21. පෞද්ගලික සායන හා සාත්තු නිවාස
22. සැර බීම (රා, අරක්කු) වෙළඳසැල් (තැබෑරුම්) පවත්වාගෙන යාම
23. වැලිගොඩදමන මඩුවක් පවත්වාගෙන යාම
24. විශේෂඥ වෛද්‍ය සේවා, උපදේශක ස්ථානයක් පවත්වාගෙන යාම
25. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
26. මිනින්දෝරුවරු
27. ඇඟළුම් කර්මාන්ත ශාලා
28. ගොඩනැගිලි සැළසුම් ශිල්පීන්
29. සැළසුම්කරුවන්ගේ ව්‍යාපාර
30. කුළී රථ ධාවකයින්
31. විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
32. මෙරට, පිටරට බීම නිෂ්පාදන ආයතන පවත්වාගෙන යාම
33. දුරකථන සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
34. ශාරීරික ව්‍යායාම් අධ්‍යාපන මධ්‍යස්ථාන

## උපලේඛනය අංක IV

ඉඩම් විකිණීමේ බද්ද (154 වගන්තිය)

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීම සම්බන්ධයෙන් ලත් මුදලින් සියයට එකක (1%) බද්දක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

10-969/1

---

## මාවතගම ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා වරිපනම් බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් සැලසී ඇති විධිවිධාන පරිදි මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ ඇතුලත පිහිටියා වූ සියළුම නිශ්චල දේපළ වර්ෂයක වාර්ෂික වටිනාකමින් පහත උපලේඛනයේ සඳහන් පරිදි දේපළ බද්දක් පිළිවෙලින් 2011 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වීමට පෙර සමාන කොටස් හතරකින් ගෙවිය යුතු අන්දමට හා එකී පනතේ 135 වැනි වගන්තිය යටතේ නියම කරනු ලබන යම් සීමා කිරීම්වලට යටත්ව 2011 වර්ෂයට පනවා අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තව ද, එකී පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාර එකී වරිපනම් බදු මුදල පනෙත් සඳහන් පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට මෙහි දැක්වෙන වට්ටම් ප්‍රදානය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2011 ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙව්වහොත් එම මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු වැනි මාසය තුල ගෙව්වහොත් එසේ ගෙවන ලද මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද දෙනු ලැබේ.

*වරිපනම් බදු සීමාව -*

01. නුවර - කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ පිලැස්ස සිට නාගහකන්ද මුදුන සීමාව දක්වා වම් පස හා දකුණු පස අදාල දේපළෙහි වාර්ෂික තක්සේරු වටිනාකමින් 4% වරිපනම් බද්දක්,

02. නුවර - කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ වැළඩ මල්ලියගොඩ හන්දියේ සිට කුරුණෑගල නුවර පළාත් සීමාව දක්වා වම් පස හා දකුණු පස අදාල දේපළෙහි වාර්ෂික තක්සේරු වටිනාකමින් 4% වරිපනම් බද්දක්,
03. නුවර පාරේ සිට බරන්දන මාර්ගයේ සීරාදුන්න කන්ද දක්වා වම්පස හා දකුණු පස අදාල දේපළෙහි වාර්ෂික තක්සේරු වටිනාකමින් 6% වරිපනම් බද්දක්,
04. දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අනිකුත් සියළුම ප්‍රදේශවලින් 6%ක වරිපනම් බද්දක්.

එච්. එස්. කේ. බී. මීගොල්ල,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව - මාවතගම.

2010 සැප්තැම්බර් මස 30 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

V උපලේඛණය

| *බැනර් හා ප්‍රදර්ශන ගාස්තු* | *බැනර් සඳහා වර්ග අඩි 1 ට රු. ශ.* | *කටවුට් සඳහා වර්ග අඩි 1 ට රු. ශ.* |
|---|---|---|
| 01. වර්ග අඩි 06 කට වැඩි නොවන්නේ නම් : | | |
| දින 14 දක්වා | 10 0 | 20 0 |
| දින 14 සිට මාසයකට | 20 0 | 30 0 |
| මාසයකට වැඩි (උපරිම මාස 06 දක්වා) | 30 0 | 50 0 |
| 02. වර්ග අඩි 06 කට වැඩි වන්නේ නම් දින : | | |
| දින 14 දක්වා | 20 0 | 20 0 |
| දින 14 සිට මාසයකට | 30 0 | 30 0 |
| මාසයකට වැඩි (මාස 06 දක්වා) | 50 0 | 50 0 |
| වර්ෂයකට | 60 0 | 60 0 |

දිවා රාත්‍රී විදුලි ආලෝක නාමපුවරු සඳහා — වර්ෂයකට වර්ග අඩියකට රුපියල් 75 0
වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු සහ සාමාන්‍ය නාමපුවරු සඳහා, — වර්ෂයකට වර්ග අඩියකට රුපියල් 50 0

***විනෝද බදු ආඥාපනතේ විනෝද බද්ද :***

1. ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% විනෝද බද්ද
2. ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බලපත්‍රයක් සඳහා රු. 1,000 0

| ***ක්‍රීඩාපිටි වෙන් කිරීමේ ගාස්තු - සාමෝදය ක්‍රීඩාපිටිය :*** | *රු. ශ.* |
|---|---|
| 1. ක්‍රීඩා තරගයක් සඳහා දිනකට | 500 0 |
| 2. සංගීත සංදර්ශනයක් සඳහා දිනකට | 10,000 0 |
| 3. සර්කස් සංදර්ශනයක් සඳහා දිනකට | 1,000 0 |
| 4. උත්සව/රැස්වීම් සඳහා දිනකට | 500 0 |

***අනෙකුත් ක්‍රීඩාපිටි වෙන් කිරීමේ ගාස්තු :***

| | |
|---|---|
| 1. ක්‍රීඩා තරගයක් සඳහා දිනකට | 100 0 |
| 2. සංගීත සංදර්ශනයක් සඳහා දිනකට | 2,000 0 |
| 3. සර්කස් සංදර්ශනයක් සඳහා දිනකට | 500 0 |
| 4. උත්සව/රැස්වීම් සඳහා දිනකට | 200 0 |

*ජල බිල් ගාස්තු - සංශෝධනය නොවන අතර 2003.01.24 වැනි දින ගැසට් පත්‍රයේ සඳහන් පරිදි අයකරනු ලැබේ.*

***විටිරේඛා ගාස්තු :***

| | |
|---|---|
| 1. ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 50 0 |
| 2. විටිරේඛා - පළමු රු. 1,00,000 සඳහා | 600 0 |
| ඊට වැඩිවන සෑම රු. 1,00,000 සඳහාම | 250 0 |
| 3. විටිරේඛා අලුත්කිරීම සඳහා | 250 0 |
| 4. පිඹුරුපත් අනුමත කිරීම සඳහා | 250 0 |
| 5. අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා | 200 0 |

*පාරිසරික බලපත්‍ර ලබාදීම :*

| | | | රු. ශත |
|---|---|---|---|
| 1. | ඉල්ලුම්පත්‍ර ගාස්තුව | | 100 0 |
| 2. | පරීක්ෂණ ගාස්තුව | රු. 1,00,000 දක්වා | 250 0 |
| | | රු. 1,00,001 සිට 2,00,000 දක්වා | 500 0 |
| | | රු. 2,00,001 සිට රු. 5,00,000 දක්වා | 1,250 0 |
| | | රු. 5,00,001 සිට රු. 10,00,000 දක්වා | 2,500 0 |
| | | රු. 10,00,001 දක්වා | 5,000 0 |
| 3. | පාරිසරික බලපත්‍ර ගාස්තුව | | 750 0 |

*පාරිසරික බලපත්‍ර අළුත් කිරීම :*

1. ඉල්ලුම්පත්‍ර ගාස්තුව 50 0
2. පරීක්ෂණ ගාස්තු ඉහත පරිදි වේ.

*දැව ප්‍රවාහන ගාස්තු :*

| | | |
|---|---|---|
| 1. | ට්‍රැක්ටර්/ලොරි ලෝඩ් එකකට | 500 0 |
| 2. | අත් ට්‍රැක්ටර් /කරත්ත ලෝඩ් එකකට | 100 0 |
| 3. | උණ දැව ට්‍රැක්ටර් / ලොරි ලෝඩ් එකකට | 100 0 |

අනතුරු ගස් පරීක්ෂණ ගාස්තු 100 0

*වාහන නවතා තබන ස්ථාන සඳහා ගාස්තු :*

1. ලියාපදිංචි ගාස්තුව 100 0

2. අවසර පත්‍ර ගාස්තුව :

(i). නගර සීමාවේ කුලී ගමන් සඳහා වාහන නවතා තබන ස්ථානවල නවතා තබන වාහන/ත්‍රීවිල් සඳහා නැවතුම් ස්ථානයේ නවතන සෑම වාහනයක් සඳහා ම රු. 10.00 ක් බැගින්

(ii). ට්‍රැක්ටරයකට මාසයකට රු. 200.00 බැගින්

(iii). නගර සීමාවෙන් පිට කුලී ගමන් සඳහා වාහන/ත්‍රීවීල් නවතා තබන ස්ථානවල නවතා තබන වාහන සඳහා අවුරුද්දකට රු. 500

| *ගොඩනැගිලි අයදුම්පත්‍ර අනුමත කිරීමේ ගාස්තු :* | *රු. ශත* |
|---|---|
| (i). ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| (ii). අනුකූලතා සහතික පරීක්ෂණ ගාස්තු | 100 0 |
| (iii). කාලය දීර්ඝ කිරීම සඳහා වර්ෂයකට | 100 0 |

(iv). පෙරසැරි ගාස්තු පහත පරිදි අයකරනු ලැබේ.

*1. ග්‍රාමීය බල ප්‍රදේශ සඳහා :*

| *ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්* | *පදිංචිය සඳහා රු. ශ.* | *වානිජ කටයුතු සඳහා රු. ශ.* |
|---|---|---|
| 45ට අඩු | 50 0 | 200 0 |
| 46-90 | 100 0 | 500 0 |
| 91-180 | 150 0 | 750 0 |
| 181-270 | 300 0 | 1,000 0 |
| 271-450 | 750 0 | 1,500 0 |
| 451-675 | 1,000 0 | 2,000 0 |
| 676-900 | 1,500 0 | 2,500 0 |
| 900 ට වැඩි | 1,500 0 | 2,500 0 |
| *2. නාගරික බලප්‍රදේශ සඳහා :* | | |
| 45ට අඩු | 500 0 | 1,000 0 |
| 46-90 | 1,500 0 | 2,000 0 |
| 91-180 | 2,500 0 | 3,000 0 |
| 181-270 | 3,500 0 | 4,000 0 |
| 271-450 | 4,500 0 | 6,000 0 |
| 451-675 | 5,500 0 | 8,000 0 |
| 676-900 | 6,500 0 | 10,000 0 |
| 901-1225 | 7,500 0 | 12,000 0 |
| 1225 ට වැඩි | 7,500 0 | 12,000 0 |

*තාවකාලික ගෝ ඝාතක ගාස්තු :*

තාවකාලික ගෝඝාතක ගාස්තුව එක් හරකෙක් සඳහා රු. 50 0

***සතිපොළ ගාස්තු :***

එක් කඩ කාමරයකින් පොළ දිනකට රු. 150 0

10-969/2

---

**මාවතගම ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා අක්කර බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තියෙන් සැලසී ඇති විධිවිධාන පරිදි මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද ඉඩම් වලින් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනු ප්‍රමාණයන්ගෙන් වූ අක්කර බද්දක් 2011 වර්ෂයට පනවා 2011 මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු 4කින් අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

01. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක රු. 50 0
02. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වන අවස්ථාවක වැඩිවන එක් හෙක්ටයාරයකට රු. 10 0

මේ පනතේ 134(7) වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි බදු මුදල් ගෙවනු ලබන ආකාරය අනුව වට්ටම් ප්‍රදානය කරන බව ද වැඩි දුරටත් දන්වා සිටිමි.

01. මුළු වර්ෂයේ ම බදු මුදල ජනවාරි මස 31 වැනි දින ඉකුත්වීමට මත්තෙන් ගෙවන්නේ නම් නියමිත බදු මුදලින් 10%ක් වට්ටමක් ද,
02. බදු මුදල කාර්තු වශයෙන් ගෙවනු ලබන අවස්ථාවකදී බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු වැනි මාසය තුළ ගෙවන්නේ නම් 5%ක වට්ටමක්.

එච්. එස්. කේ. බී. මීගොල්ල,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව - මාවතගම.

2010 සැප්තැම්බර් මස 30 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-969/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.